# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2218/56 - 2021 මාර්තු මස 10 වැනි බදාදා - 2021.03.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ තෝරාඑවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාවට තෝරාඑවා ඇති සභිකයෙකු ලෙස පත් වූ රාජේස්වරි සිරිදරන් අයත් වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාවට තෝරාඑවා ඇති සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා කන්දයියා පරමේස්වරි නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, කාන්දිරාසා කාන්දීපන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින්, කන්දයියා පරමේස්වරි, මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාවට තෝරාඑවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**කේ. කාන්දීපන්,**
තේරීම්භාර නිලධාරි,
මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාව.

2021 මාර්තු මස 09 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මුලතිව්.

03 - 683


1A - G 33920 — 35 (2021/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*